

**අජිත් නිවාඩ් කබ්රාල්**
**අධිපති**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

## මෙම ග්‍රන්ථය සහ කතුවරයා ගැන

මෙම ආර්ථික විද්‍යා ග්‍රන්ථය පී. සමරසිරි මහතා විසින් රචිත තෙවන ග්‍රන්ථයයි. පළමු ග්‍රන්ථය වූ "මුදල් ගනුදෙනු, බැංකු සහ ආර්ථිකය" 2010 අගෝස්තු මස ද, දෙවන ග්‍රන්ථය වූ "මූලික ආර්ථික විද්‍යා මූලධර්ම විග්‍රහය" 2011 නොවැම්බර් මස ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම නව ග්‍රන්ථය තුළින් ක්ෂුද්‍ර, සාර්ව, මූල්‍ය, රාජ්‍ය සහ විදේශීය යනුවෙන් පුළුල් ලෙස ආර්ථිකයක ක්‍රියාකාරීත්වය බෙදා ඒ අනුව ප්‍රධාන මූලධර්ම සහ ප්‍රායෝගික කරුණු ඉදිරිපත් කොට ඇත. සංකීර්ණ විෂය කරුණු පියවරින් පියවර ඉතාමත් සරල බස් වහරක් යොදාගෙන ඉදිරිපත් කොට ඇති බැවින් මෙම ග්‍රන්ථය පරිශීලනය ඉතාමත් පහසුය. එබැවින්, මෙය අ.පො.ස. උසස් පෙළ, විශ්ව විද්‍යාල සහ වෘත්තීමය පාඨමාලාවන්හි ආර්ථික විද්‍යාව සහ මූල්‍ය විෂයන් හදාරණ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ උගතුන්ට ද ඉතා ප්‍රයෝජනවත් ග්‍රන්ථයක් බව මගේ හැඟීමයි.

සමරසිරි මහතා පසුගිය වසර 30 ක කාලය තුළ ආර්ථික හා මූල්‍ය විෂයන් රාශියක් සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුවේ විවිධ තනතුරුවල සේවය කිරීමෙන් ලද පෘථුල දැනුම මෙම ග්‍රන්ථය තුළින් මනාව පිළිබිඹු වෙයි. ආර්ථික විද්‍යාව පිළිබඳව කොළඹ විශ්ව විද්‍යාලයෙන් ගෞරව උපාධියක් ද, ඇමෙරිකා එක්සත් ජනපදයේ කැන්සස් විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇති ඔහු දේශීය සහ විදේශීය වශයෙන් ආර්ථික සහ මූල්‍ය විෂයන් පිළිබඳ පුහුණු පාඨමාලා සහ සම්මන්ත්‍රණ රාශියකට සහභාගි වී ඇති අතර ආර්ථික සහ මූල්‍ය විෂයන් පිළිබඳව ශාස්ත්‍රීය ලිපි ගණනාවක් ද පළකොට ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති, මුදල් මණ්ඩලයේ ලේකම්, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ උප සභාපති වශයෙන් වසර කිහිපයක් පුරා සේවය කරන සමරසිරි මහතා ආර්ථික විද්‍යාව සහ මූල්‍ය ක්‍රමය පිළිබඳ දැනුම සහ අත්දැකීම් බහුල කෙනෙකි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආර්ථික සහ මූල්‍ය කටයුතු පිළිබඳව සාමාන්‍ය දැනුම මෙන්ම විෂය දැනුම මහජනයා අතර බෙදාහැරීම පිණිස විවිධ ප්‍රකාශනයන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර එහි තවත් පියවරක් වශයෙන් සමරසිරි මහතාගේ මෙම තෙවැනි ආර්ථික විද්‍යා ග්‍රන්ථය ප්‍රකාශයට පත්කරනුයේ ඉතාමත් සතුටිනි. මෙම ග්‍රන්ථය විශාල පිරිසකගේ න්‍යායාත්මක සහ ප්‍රායෝගික ආර්ථික විද්‍යා සහ මූල්‍ය දැනුම ප්‍රගුණ කිරීමට උරදෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාතික මෙහෙවරක් බව මගේ දැඩි විශ්වාසයයි.




**පී. සමරසිරි**

සහකාර අධිපති
සහ
මුදල් මණ්ඩලයේ ලේකම්,
ශ්‍රී ලංකා මහ බැංකුව



ISBN – 978-955-575-259-6

මුද්‍රණය: ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලය,
රාජගිරිය

මිළ රු. 750/-


ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති   පී. සමරසිරි   ශ්‍රී ලංකා මහ බැංකුව

# ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති

**පී. සමරසිරි**



**ශ්‍රී ලංකා මහ බැංකුව**